# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2354/10 – 2023 ඔක්තෝබර් මස 17 වැනි අඟහරුවාදා – 2023.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: GPN/DS/LND/3/1/6/3878/01.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: LD/05/2007/HW/357.

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් මොහොමඩ් මුක්තාර් මොහොමඩ් ශර්ෆාස් වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වන වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම අත්කර ගැනීම සඳහා නියමිත වන්දි මුදල වන රුපියල් දහසක (රු. 1,000/-) මුදල අයිතිකරුවන්ට ලබා ගැනීම පිණිස බද්දේගම දිසා අධිකරණයේ නඩු අංක LA-245 යටතේ බැර කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

එම්. එම්. එම්. ශර්ෆාස්,
ප්‍රාදේශීය ලේකම්,
ගෝනාපීනුවල.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ඉඩමේ නම | : අලපලාවත්ත | | |
| මූලික පිඹුරු අංකය | : ගා 3878 | | |
| කැබලි අංකය | : 01 | | |
| කැබලි ගණන | : 01 | | |
| ප්‍රමාණය | : හෙක්. 0.0023 | | |
| ඉඩම පිහිටි ගම/ගම් | : ගෝනාපීනුවල ගම - (60B ගෝනාපීනුවල - මධ්‍යම - ග්‍රාම නිලධාරි වසම) | | |
| පිහිටීම | : | උතුරට | : කේ. ජී. ටියුඩර් හිමිකම් කියන අලපලාවත්ත සහ මාර්ගය |
| | | නැගෙනහිරට | : මාර්ගය සහ මාර්ග (මා.සං.අ.) |
| | | දකුණට | : මාර්ග (මා.සං.අ.) සහ කැබලි අංක 02 |
| | | බටහිරට | : කැබලි අංක 02, සිරිල් දිසානායක සහ කේ. ජී. ටියුඩර් හිමිකම් කියන අලපලාවත්ත. |

යන මායිම් ඇතුළත පිහිටි, ප්‍රමාණයෙන් අක්කර: - රූඩ්: - පර්චස්: 0.9 (හෙක්. 0.0023) ක්වූ, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද මූ.පි.ගා. 3878 හා 2011.03.31 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස සඳහන් අලපලාවත්ත නමැති ගෝනාපීනුවල ගමේ (60B ගෝනාපීනුවල - මධ්‍යම - ග්‍රාම නිලධාරි වසම) පිහිටි ජනරජය සතු ඉඩම් කට්ටිය වේ.

EOG 10 - 0174


1A – G040539 – 09 (2023/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*